# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.08.27 පැය 0625 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1650/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු</u>**

### 01. මනුෂ්‍ය ඝාතනයක් - මකුළුගස්වැව පොලිස් වසම.

පහරදී පුද්ගලයෙකු පැහැරගෙන ගොස් ඇති බවට මකුළුගස්වැව පොලිස් ස්ථානයට 2025.08.25 වන දින උදෑසන කාලයේ ලද 119 කෙටි පණිවිඩයකට අනුව විමශර්න ආරම්භ කර ඇත.

සිද්ධිය සම්බන්ධයෙන් සිදු කරන ලද විමශර්නයට අනුව පැහැරගැනීමට ලක් වූ පුද්ගලයා යතුරු පැදියෙන් ගමන් කරමින් සිටි අවස්ථාවේදී තවත් පුද්ගලයෙකු විසින් යතුරු පැදියෙන් ගමන් කරන ලද මාගර්ය හරස් කර නවතා පහරදී ඝාතනය කර ඇති බවට අනාවරණය වී ඇත.

**මරණකරු වයස අවුරුදු 59 ක් වූ දේවහුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සිද්ධියට සම්බන්ධ සැකකරු වන වයස අවුරුදු 26 ක නාවික හමුදා සෙබලෙකු අත්අඩංගුවට ගෙන ඇති අතර කලක පටන් මරණකරු සමඟ පැවති පැවති ආරවුලක් දුරදිග යාම හේතුවෙන් සැකකරු විසින් මෙම ඝාතනය සිදු කර ඇති බවට දැනට සිදු කරන ලද විමශර්නයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය දඹුල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර මකුළුගස්වැව පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

### 02. වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් සිදු කිරීමේ අපරාධයකට සම්බන්ධ සැකකරුවෙකු අත්අඩංගුවට - රත්නපුර කොට්ඨාස අපරාධ විමශර්න කායර්ංශය.

2025.06.30 වන දින කහවත්ත පොලිස් වසමේ යායින්න ප්‍රදේශයේදී පුද්ගලයෙකුට වෙඩි තබා ඝාතනය කිරීමේ අපරාධය සම්බන්ධයෙන් රත්නපුර කොට්ඨාස අපරාධ විමශර්න කායර්ංශය මගින් වැඩිදුර විමශර්න ආරම්භ කර තිබිණි.

ඒ අනුව ලද තොරතුරක් මත ඉහත අපරාධයට ආධාර අනුබල දුන් සැකකරුවෙකු 2025.08.26 වන දින දහවල් කාලයේ රත්නපුර පොලිස් වසමේ පැල්වාඩිය ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 28 ක් වන රත්නපුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

රත්නපුර කොට්ඨාස අපරාධ විමශර්න කායර්ංශය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

03. **වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයකට තැත් කිරීමේ අපරාධයකට සම්බන්ධ සැකකරුවෙකු හා සැකකාරියක් අත්අඩංගුවට - බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසය.**

2025.07.18 වන දින දෙහිවල පොලිස් වසමේ දුම්රියපොල පාර ප්‍රදේශයේදී යතුරුපැදියකින් පැමිණි නාඳුනන පුද්ගලයන් දෙදෙනෙකු විසින් නිවසක සිටි පුද්ගලයෙකුට වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් සිදු කිරීමට තැත් කිරීමේ අපරාධය සම්බන්ධයෙන් බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසය මගින් විමර්ශනයක් ආරම්භ කර තිබිණි.

ඒ අනුව ලද තොරතුරක් මත ඉහත අපරාධයට ආධාර අනුබල දුන් සැකකරුවෙකු 2025.08.26 වන දින උදෑසන කාලයේ බොරලැස්ගමුව ප්‍රදේශයේදී අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 20 ක් සමඟ සහ දෙල්ගහවත්ත, හල්පිට ප්‍රදේශයේදී අපරාධයට ආධාර අනුබල ලබාදුන් සැකකාරියක්ද අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු අවුරුදු 23 ක් වන පොල්ගස්ඕවිට ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වන අතර සැකකාරිය වයස අවුරුදු 38 ක් වන කැස්බෑව ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

04. **මාරක රිය අනතුරක් - බණ්ඩාරදූව පොලිස් වසම.**

2025.08.26 වන දින සවස් කාලයේ බණ්ඩාරදූව පොලිස් වසමේ ගොනාගොල්ල බණ්ඩාරදූව මාගර්යේ ගොනාගොල්ල ප්‍රදේශයේදී ගොනාගොල්ල දෙස සිය බණ්ඩාරදූව දෙසට ධාවනය වූ යතුරු පැදියක් එම දෙසටම ගමන්ගත් පාපැදියක පසුපස ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පාපැදිකරු හා යතුරු පැදිකරු ප්‍රතිකාර සඳහා ගොනාගොල්ල රෝහලට ඇතුලත් කිරීමේදී පා පැදිකරු මියගොස් ඇති අතර යතුරු පැදිකරු වැඩිදුර ප්‍රතිකාර සඳහා අම්පාර රෝහල වෙත මාරුකර යවා ඇත.

**මරණකරු වයස අවුරුදු 76 ක් වූ නවගිරියාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය අම්පාර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. බණ්ඩාරදූව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

05. **මාරක රිය අනතුරක් - මුල්ලේරියාව පොලිස් වසම.**

2025.08.26 වන දින දහවල් කාලයේ මුල්ලේරියාව පොලිස් වසමේ කොටිකාවත්ත අංගොඩ දෙල්ගහවත්ත මාගර්යේ දෙල්ගහවත්ත ප්‍රදේශයේදී වැලිවල දෙස සිට මුල්ලේරියාව දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක ඉදිරිපස රෝදය ගැලවීයාම හේතුවෙන් රියදුරුට රථය පාලනය කරගත නොහැකිව මාගර්යේ දකුණු පසට ඇදී ගොස් ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි යතුරු පැදියක ගැටී පෙරළීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරු පැදිකරු හා ත්‍රීරෝද රථ රියදුරු නැගෙනහිර කොළඹ රෝහලට ඇතුලත් කිරීමේදී යතුරුපැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 41 ක් වූ අංගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය නැගෙනහිර කොළඹ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මුල්ලේරියාව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**